# 17

# මහින්දාගමනයෙන් ශ්‍රී ලාංකික ජන ජීවිතය ඔපවත් වූ ආකාරය

බුදුදහමේ ආශීර්වාදය ලක්වැසියනට දායාද වූයේ මිහිඳු මහ රහතන් වහන්සේ ප්‍රධාන ධර්මදූතයන් වහන්සේලාගේ සම්ප්‍රාප්තියෙනි. ලක්දිව හා දඹදිව සමකාලීන රාජ්‍ය තාන්ත්‍රිකයන් අතර පැවති සබඳතාව ද හේතු කොටගෙන සිදු වී යැයි පැවසෙන එම අනුස්මරණීය සිදුවීම පිළිබඳ ව ඇති වාර්තා අරබයා විද්වතුන් අතර නොයෙක් මති මතාන්තර ඇත. එහෙත් මහින්දාගමනයේ ඓතිහාසිකත්වයත්, එමගින් මෙරට ඉතිහාසයට හා ජන සමාජයට ඇති වුණු යහපත් බලපෑමත් සනාථ කිරීමට බොහෝ කරුණු ඇති බව කිව යුතු ය.

මහින්දාගමනය සිදු වූයේ සම්බුද්ධ පරිනිර්වාණයෙන් 236 වන වසරෙහි එනම්, දෙවනපෑතිස් රජතුමාගේ පළමු රාජ්‍ය වර්ෂයේ හෙවත් ධර්මාශෝක අධිරාජයාගේ 18 වැනි රාජ්‍ය වර්ෂයේ යැයි සැලකේ.

ඉහත කී පරිදි මිහිඳු මාහිමියන් විසින් මෙරටට ගෙන එන ලද බුද්ධ ධර්මයත්, බෞද්ධ සංස්කෘතියත් මෙරට ජන සමාජය, රාජ්‍ය පාලනය, ආර්ථිකය, අධ්‍යාපනය, භාෂාව, සාහිත්‍යය, කලා ශිල්ප, සිරිත් විරිත්, ඇදහිලි, පුද පූජා, විශ්වාස හා සාරධර්ම ද ගොඩනගමින් පුළුල් ලෙස රක්ෂණය, පෝෂණය කළ බව ප්‍රකට කරුණකි. ඒ අනුව මහින්දාගමනයත් ඊට ම එක් වූ දුමින්දාගමනයත් දේශීය බෞද්ධ සංස්කෘතියේ ආරම්භයයි. මිහිඳු මාහිමියෝ අලුත් ආගමක් පමණක් නොව ඒ වනවිටත් ගොඩනැඟී තිබූ කීර්තිමත් සභ්‍යත්වයක් ද මේ රටට දායාද කළහ. එය බෞද්ධ ඉගැන්වීම් පදනම් කොට ගත්තකි.

බුදුදහමත්, එම සංස්කෘතියත් මෙරට තහවුරු කිරීමට මිහිඳු මාහිමියන්ගේ මනා සැලසුම්කරණය, කැපවීම හා ක්‍රියාකාරීත්වය මෙන් ම දෙවනපෑතිස් මහරජතුමාගේ ආගමික උද්යෝගය හා නොමඳ කැපවීම ද උපකාරී වූ බවට සැක නැත. එදා පටන් අද දක්වා ගෙවී ගිය සියවස් 25 කට ආසන්න කාලය මුළුල්ලේ ශ්‍රී ලාංකික ජන සමාජයට බුදුදහමින් ලැබුණු දැවැන්ත පෝෂණය ආරම්භ වන්නේ මහින්දාගමනයෙනි. එය පහත දැක්වෙන පරිදි කාරණාමය වශයෙන් සම්පිණ්ඩනය කොට හඳුන්වා දිය හැකි ය.

- මහින්දාගමනයෙන් නොබෝ දිනකින් ලක්දිව ථේරවාද බෞද්ධ මූලස්ථානය වූ මහා විහාරය මහමෙවුනාවෙහි පිහිටුවීම හා එම ආදර්ශය ඔස්සේ අනුක්‍රමයෙන් ලක්දිව සියලු ගම් නියම්ගම්වල වෙහෙර විහාර ඇති වීම.

- ලක්දිව උපන් කුල කුමරෙකු ලෙස මහා අරිට්ඨ කුමරු ද, තවත් කුමාරවරුන් 500ක් ද පැවිදි කරමින් දේශීය භික්ෂු සමාජය ආරම්භ කිරීම.

- මහා විහාරය කේන්ද්‍ර කොටගත් ජාතික අධ්‍යාපන ක්‍රියාවලියක ආරම්භය හා එය සියලු විහාරාරාම ඔස්සේ ක්‍රමයෙන් පැතිර යාම.

- සංඝමිත්තා මහරහත් මෙහෙණින් වහන්සේගේ සම්ප්‍රාප්තිය හා එමගින් මෙරට විවිධ අංශවලට බෞද්ධ බලපෑමක් වූ ශ්‍රී මහා බෝධීන් වහන්සේ වැඩමවා රෝපණය කිරීම.

- අනුලා බිසව ප්‍රධාන රාජකීය කාන්තාවන්ට පැවිද්ද ලබාදෙමින් ලක්දිව භික්ෂුණී සමාජය ආරම්භ වීම.

- බුද්ධ ප්‍රතිමා, බෝධිසත්ව ප්‍රතිමා, සුවිසල් මහා සෑයවල් ආදිය ලක්වැසියන්ට දායාද වීම.

- ශ්‍රී ලංකාවේ විහාරාරාම ආශ්‍රිත ව චිත්‍ර, මූර්ති, කැටයම්, ගෘහ නිර්මාණ ආදි විසිතුරු හා විශිෂ්ට කලාකෘති ඇති වීම.

- භාරතීය බ්‍රාහ්මී අක්ෂර ද ආදර්ශයට ගනිමින් මිහිඳු මාහිමියන්ගේ අනුශාසනා පරිදි සිංහල අක්ෂර මාලාව සකස් ව ප්‍රචලිත වීම.

- බෞද්ධ මූලාශ්‍රය පාදක කොට ගනිමින් අනුරාධපුර යුගයේ පටන් ම වටිනා ගද්‍ය පද්‍ය සාහිත්‍ය කෘති සිංහල මෙන් ම  පාලි නිර්මාණ ලෙස ද බිහි වීම.

- ශ්‍රී ලංකාවේ රාජ්‍ය පාලකයන් බෞද්ධ ඉගැන්වීම් අනුව රට පාලනය කිරීම හා බෝසත් ආදර්ශය අනුව දැහැමි රාජ්‍ය පාලනයක් පවත්වාගෙන යාමට පෙළඹීම.

- ශ්‍රී ලංකාවේ රාජ්‍ය තාන්ත්‍රික ආර්ථික ප්‍රතිපත්ති මෙන් ම  පොදුජන ආර්ථික ක්‍රියාකාරකම් ද බෞද්ධ අභාසය ඇති ව සකස් වීම.

- ශ්‍රී ලංකාවේ බෞද්ධ ජන ජීවිතයට ම ආවේණික වූ වන්දනාමාන හා පුදසිරිත් පද්ධතියක් බිහි වීම.

- මෙරට ජනයාගේ විශිෂ්ට හා අනන්‍ය ලක්ෂණයක් ලෙස හැඳින්විය යුතු උසස් සාරධර්ම කෙරෙහි කැපවීමේ ගුණය වර්ධනය වීම.



බුදුදහම නැමැති උතුම් දායාදය රැගෙන ලක්දිවට සපැමිණි මිහිඳු මාහිමියන් ඇතුළු ධර්මදූතයන් වහන්සේලාගේ වාසය සඳහා දෙවනපෑතිස් මහ රජතුමා විසින් රාජකීය උද්‍යානය වූ මහමෙවුනාව පූජා කරන ලදි. මහා විහාරය ඉදිකරන ලද්දේ එම භූමිය තුළ ය. එහි ඒ ඒ ගොඩනැගිලි හා සිද්ධස්ථාන පිහිටුවිය යුතු තැන් මිහිඳු මාහිමියන් විසින් දෙවනපෑතිස් රජුට පෙන්වා දුන් බව ද කියැවේ. එසේ ඇති වූ මහා විහාරයට අයත් ගොඩනැගිලි තංගුත්ත පිරිවෙන, කාලපාසාද පිරිවෙන ආදි නම්වලින් හඳුන්වා තිබේ. මෙසේ ආරම්භ වී වැඩිදියුණු වූ ලක්දිව ප්‍රථම ථේරවාද බෞද්ධ මූලස්ථානය අධ්‍යාපනික, ආගමික, සංස්කෘතික වශයෙන් ඉටු කළේ විශාල මෙහෙවරකි.

ලක්දිව බුදුදහම ප්‍රතිස්ථාපනය වීම සඳහා මෙරට උපන් කුල කුමරකු පැවිදි උපසම්පදා කළ යුතු යැයි ද එම භික්ෂුවගේ සහභාගිත්වයෙන් විනය සංගායනාවක් කළ යුතු යැයි ද පිළිගැනිණි. ඒ අනුව දෙවනපෑතිස් රජුට බෑනණු කෙනකු වූ මහා අරිට්ඨ කුමරු ඇතුළු 500ක් කුමාරවරු පැවිදි කරවන ලදහ. මෙසේ ආරම්භ වූ මෙරට භික්ෂු සමාජය එදා පටන් අද දක්වා ම බුද්ධ ධර්මයේ ආරක්ෂාවත් සංස්කෘතියේ යහපැවැත්මත් තහවුරු කරමින් විශාල සමාජ සංස්කෘතික මෙහෙවරක යෙදී සිටින බව රහසක් නොවේ.

දුමින්දාගමනය යනුවෙන් හැඳින්වෙන්නේ දඹදිව බුද්ධ ගයාවෙහි වැඩසිටින ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ දක්ෂිණ ශාඛාව මෙරටට වැඩම වීමයි. සංඝමිත්තා මහරහත් මෙහෙණිය එහි ප්‍රමුඛත්වය ගත් බව ද, දෙවන පෑතිස් මහ රජු මහ පුදසිරිත් සහිත විසිතුරු පෙරහැර පවත්වා බෝධීන් වහන්සේ පිළිගෙන මහමෙවුනාවෙහි රෝපණය කළ බව ද සඳහන් වේ. මෙම සිදුවීම මෙරට දසත පැතිර ගිය මහා බෝධි සංස්කෘතියක ආරම්භය විය.

එම බෝධීන් වහන්සේගේ ආරක්ෂාව සඳහා අටළොස් කුලයක ජනයා ලක්දිවට පැමිණි බව ද, විවිධ ශිල්ප කලාවන්හි නිපුණයන් වූ ඔවුන් මෙරට ශිල්ප කලා පෝෂණයට විශාල මෙහෙවරක් කළ බව ද පිළිගැනේ.

සංඝමිත්තා මහරහත් මෙහෙණින් වහන්සේ ලක්දිවට වැඩමවන ලද්දේ මිහිඳු මාහිමියන්ගේ හා දෙවනපෑතිස් රජුගේ ද ආරාධනය අනුවයි. එම ආගමනයෙහි ප්‍රධාන අරමුණ වූයේ භික්ෂුණී සමාජය මෙරට පිහිටුවීමයි. භික්ෂු සමාජය මෙරට පිහිටුවීමෙන් පසු තමන්ට ද පැවිදි වීමේ වරම ලබාදෙන ලෙස ඉල්ලා සිටි අනුලා දේවිය ප්‍රධාන කාන්තාවන් සඟමිත් තෙරණිය විසින් පැවිදි කරන ලද්දේ ඒ අනුවයි. එය මෙරට බෞද්ධ කාන්තාවන් ලැබූ විජයග්‍රහණයකි.

ලක්දිව දේශීය බෞද්ධ කලාව ඇරඹෙන්නේ ද මහින්දාගමනයෙන් පසුවයි. දනට නටබුන් ව ඉතිරි ව ඇති පැරණි බෞද්ධ කලා නිර්මාණ රැසකි. බුද්ධ ප්‍රතිමා සහ බෝධිසත්ව ප්‍රතිමා ගණනාවකි. අනුරාධපුර සමාධි පිළිමය, තොලුවිල බුදු පිළිමය, අවුකන හිටි පිළිමය, පොළොන්නරුව ගල් විහාර ප්‍රතිමා ආදිය මේ අතර වඩාත් ප්‍රකට ය. එසේ ම අනුරාධපුරයේ ද පොළොන්නරුවේ ද දක්නට ලැබෙන සුප්‍රකට ස්තූප ඇතුළු රට පුරා ඉදි වූ ස්තූප රාශියකි. වෙස්සගිරිය, හිඳගල ආදි ස්ථානවල දක්නට ලැබෙන බෞද්ධ චිත්‍ර ඇතුළු අනුරාධපුර පොළොන්නරු යුගවල පටන් මෑත මහනුවර යුගය දක්වා හමුවන මුරගල, සඳකඩපහණ, කොරවක්ගල වැනි විවිධ මූර්ති, කැටයම් සමූහය ද බුදුසමය පසුබිම් කොටගත් හෙළ කලාවේ විශිෂ්ටත්වය විදහාපායි.

මහින්දාගමනය සිදුවන විට මෙරට භාවිතයේ පැවති අක්ෂර මාලාව කවරේද යි නිශ්චිත ව පැවසිය නොහැකි ය. කෙසේ වුව ද මිහිඳු මාහිමියන් විසින් ඉන්දියාවේ පැවති බ්‍රාහ්මී අක්ෂර ද ආදර්ශයට ගනිමින් සිංහල අක්ෂර මාලාව සකස් කරන ලද බව පිළිගැනේ. පසු කාලීන ව දේශීය අධ්‍යාපනය මෙන් ම සාහිත්‍යය ද සංවර්ධනයට එය විශාලතම පිටුබලයක් විය.

බුදුසමය මෙරට පැවති මුල් අවධියේ දී ම ත්‍රිපිටකය සඳහා සිංහලෙන් අටුවා (හෙළටුවා) සම්පාදනය කළ බව පිළිගැනේ. මහා අටුවා, කුරුංදි අටුවා, මහා පච්චරී අටුවා ආදි වශයෙන් එහි කොටස් නම් කර ඇත. කෙසේ වුව ද සිංහල සාහිත්‍යයේ මෙන් ම බුද්ධ ධර්මයේ ද පෝෂණයට හෙළටුවා සම්පාදනය විශාල මෙහෙවරක් විය. එසේ ම අනුරාධපුර යුගයේ පටන් ම ජාතකට්ඨකථා, ධම්මපදට්ඨකථා ආදි බෞද්ධ මූලාශ්‍රය ද වෙනත් මූලාශ්‍රය රැසක් ද පාදක කොටගෙන ගද්‍ය පද්‍ය නිර්මාණ රාශියක් බිහිවී තිබේ. සිංහල හා පාලි භාෂා මාධ්‍ය කොටගෙන වැඩුණු එම සාහිත්‍යයට මුල පිරුවේ ද මහින්දාගමනයයි.

ලාංකේය රජදරුවන් බෞද්ධයන් විය යුතු ය, ඔවුන් බෝසතුන් ආදර්ශයට ගත යුතු ය, එසේ ම ජාතක කතාදියේ සඳහන් දසරාජ ධර්මයෙන් රාජ්‍ය පාලනය කළ යුතු යැයි පිළිගැනීමක් එදා මෙරට සමාජගත වී තිබිණ. එසේ සමාජගත වූයේ බුදු දහම මෙරටට දායාද කොට දීමෙන් පසු ව ය. එසේ ම අතීත රජවරුන් බොහෝ දෙනකු

සම්බුද්ධ ශාසනයේ යහපැවැත්මට දැවැන්ත මෙහෙවරක් කර ඇති බව ප්‍රකට ය. රජුන් සහ භික්ෂූන් වහන්සේලා අතර පැවතියේ ගැඹුරු සබඳතාවකි. රජවරු විහාරාරාම ඉදිකර දෙමින් බොහෝ දේපළ පවරා දෙමින් බුද්‍ධ සසුනට හා භික්ෂූන් වහන්සේලාට අනුග්‍රහ කළහ; භික්ෂූන්ගේ අනුශාසනා රාජ්‍ය පාලනයේ දී නිබඳ ව ම අපේක්ෂා කළහ.

බුදුදහම අනුව රජය විසින් මෙන් ම මහජනයා විසින් ද ආර්ථික කටයුතු සිදු කළ යුත්තේ ධාර්මික ව යැයි ප්‍රකට ය. එම අවබෝධය පැරණි බොහෝ රජදරුවන් තුළ මෙන් ම මහජනයා තුළ ද පැවතුණි. ඒ අනුව කෘෂිකර්මාන්තය, වෙළෙඳාම වැනි ධනෝපායන මාර්ග ධාර්මික ව පවත්වාගෙන යාමට පෙළඹී තිබේ. බොහෝ විට උපයන ධනය වැය කර ඇත්තේ ද ධර්මානුකූල ව යැයි සැලකිය හැකි ය.

මහින්දාගමනය සිදු වූ මුල් අවස්ථාවේ පටන් ම ශාරීරික, පාරිභෝගික හා උද්දේසික යන ත්‍රිවිධ චෛත්‍ය ගොඩනගා තිබූ බවත්, ඒ වටා නොයෙකුත් පුද පූජා, වන්දනා, වතාවත් ආදිය සිදු කළ බවත් පෙනේ. ශ්‍රී මහා බෝධි රෝපණය, ථූපාරාම දාගැබ පිහිටුවීම වැනි සිදුවීම් වඩාත් මුල් අවධියට අයත් ය. එම පූජෝත්සව පිළිබඳ විස්තර මූලාශ්‍රයවල දැකගත හැකි ය. පසුකාලීන ව ලියැවුණු පාලි අට්ඨකථාවල ලක්දිව බෞද්ධ පුදසිරිත් පිළිබඳ බොහෝ තොරතුරු සඳහන් වේ.

ලක්දිව අතීත සමාජයෙහි සරල-දැහැමි දිවිපෙවෙතක් ගත කළ, සාරධර්ම බෙහෙවින් ම අගය කළ ගැමියන් බහුල වූ බවට සාධක බොහෝ ය. ඔවුහු සැදැහැවත් වූහ; දානාදී පිංකම් පැවැත්වීමෙහි බෙහෙවින් රුචි කළහ; නිබඳ ව ම වෙහෙර බෝමළු ආදියට රැස් ව ඉමහත් අභිරුචියකින් පුදසිරිත් පැවැත්වූහ. රජ දරුවන් පවා එම පිළිවෙත්හි නිරත වූ බවට සාධක තිබේ. වැඩිහිටියන්ට සැලකීම, ආගන්තුක සත්කාරය, මවුපිය උපස්ථානය ආදිය ඔවුනගේ ජීවිතවලට කාවැදී තිබිණ. සමාජයේ ඒ ඒ ජන කොටස් අතර පැවතිය යුතු සාරධර්ම ඔවුහු කඩ නොකළහ. සාමකාමී ව හා දැහැමි ව ඉතා ආදර්ශවත් දිවි පෙවෙතක් ඔවුන් ගත කළ බව පෙනේ. මෙම ළැදියාවට පදනම වැටුණේ බුදුදහමෙනි.

මේ අනුව ලක්දිව ලොකු කුඩා අප හැමගේ යුතුකම හා වගකීම වන්නේ මහින්දාගමනය තුළින් උපන් බෞද්ධ අධ්‍යාපනය, කලාව, සාහිත්‍යය, පුදසිරිත්, සාරධර්ම ආදි උරුමයන් නොවෙනස් ව ආරක්ෂා කර ගැනීමයි; ඒ සඳහා ප්‍රායෝගික ව ම කටයුතු කිරීමයි.

අපගේ දේශීය අනන්‍යතාව තහවුරු කරන ඉහත කී උත්තම සංස්කෘතික දායාදවල වටිනාකම තේරුම් ගනිමින් හැම විට ම එම දායාද අගය කරමින් ඒවායේ චිර පැවැත්ම සඳහා ක්‍රියා කිරීම ගුරු සිසු අප සැමගේ යුතුකම වේ.

## සාරාංශය

මිහිඳු මහරහතන් වහන්සේගේ ලංකාගමනය මෙරට බෞද්ධ සංස්කෘතියේ සමාරම්භය සනිටුහන් කරන ඓතිහාසික සිද්ධියයි. ඒ හේතුවෙන් ලක්වැසියනට උරුම වූ දායාද රැසකි. ථේරවාද බුදුදහම හැරුණුවිට එහි ආලෝකය තුළින් උපන් භාෂාව, සාහිත්‍යය, අධ්‍යාපනය, කලා ශිල්ප, ආර්ථික හා දේශපාලන පිළිවෙත්, සාරධර්ම හා පුද සිරිත් ද මෙහිලා සඳහන් කළ හැකි ය. එම දායාද සුරැකීම අපගේ යුතුකමයි.

## ක්‍රියාකාරකම

1. පහත වගුව සම්පූර්ණ කරන්න.

| මහින්දාගමනයෙන් ලත් දායාද | දුමින්දාගමනයෙන් ලත් දායාද |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |

## පැවරුම

මහින්දාගමනයේ ප්‍රතිඵල දැක්වෙන සිතුවම් හෝ ඡායාරූප එකතුවක් සකස් කරන්න.

## පුහුණුවට

සමණාමයං මහාරාජ
ධම්ම රාජස්ස සාවකා
තවේව අනුකම්පාය
ජම්බුදීපා ඉධාගතා